

**‘මා නිවත්ත අභික්කම’ – නො නැවත ඉදිරියට යවු**

| 58 වන කාණ්ඩය | බු.ව. 2559 නවම් මස පුරපසළොස්වකදා ක්‍රි.ව. 2016 පෙබරවාරි මස 22 වන දා | 10 වන කලබ |
|---|---|---|

# බොදු බව

අපේ බුදු බැතියෝ - විදසුන් නුවණ ඇතියෝ
එ හෙයින් දයාලු - දැමියෝ වැර වඩන්නෝ

කිසි වෙනසක් නැතුව - කාටත් ඉතා අදරින්
පිහිට වන බව ම යි - සුදනෙනි අනේ බොදු බව

කිසි වෙනසක් නැතුව - දුප්පත් හැම දෙනාට ම
මෙත් කුලුණු දෙ තනේ - කිරි දීම ම යි බොදු බව

- සිරි වජිරාරාමවාසී ව වැඩ වුසූ
**පූජ්‍ය පඹුරන මෙත්තෙයය හිමිපාණෝ**



# සත්පුරුෂ ධර්ම

අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය වැලිගම ඤාණරතන මහානායක මාහිමිපාණන් වහන්සේ විසිනි.

(පසුගිය කලබ හා සබැඳේ)

## නුවණැති බව

සත්පුරුෂ ගුණ අතර සත් වැනි ගුණය නුවණැති බව යි. යම් කිසිවක් ගැන නිවැරදි අවබෝධයක් ඇතිකර ගතහැකිවනුයේ දියුණු කරගත් නැණ බලයෙනි. දැනගැනීම ත්‍රිවිධ ය. යම්තම් දැනගැනීම, තරමක් දැනගැනීම, සම්පූර්ණයෙන් දැනගැනීම වශයෙනි. නුවණ මුහුකුරා නොගිය ළදරුවකු ස්වර්ණය (රත්රන්) ගැන දිග පළල සහ අලංකාරය පමණක් සිතාග න්නට සමර්ථ බව වැනි යම්තම් දැනගැනීම "සඤ්ඤා" නම්. සාමාන්‍ය ගැමියකු ස්වර්ණය ගැන තරමක අවබෝධයක් ඇතිකර ගන්නාක් මෙන් යමක් ගැන ඇතිකර ගන්නා වූ තරමක අවබෝධය විඤ්ඤාණ නම්. රන්කරුවකු ස්වර්ණය ගැන හැම තරාතිරමක් ම දැනගන්නා සේ යමක් ගැන සැම ආකාරයෙකින් ම දැනැ ගැනීම පඤ්ඤා නම්. මෙහි දී නුවණැති බව ය යි කියනු ලබන්නේ ඒ ප්‍රඥාව යි. පහනක් දැල්වීම නිසා අන්ධකාරය දුරු වැ යන්නාක් මෙන් ම ප්‍රඥා ප්‍රදීපයෙන් මෝහාන්ධකාරය දුරු වන්නේ ය.

මේ ප්‍රඥාව ධර්මයන්ගේ ඇතිතතු අවබෝධ කිරීම් වශයෙන් ඒකාකාර වන අතර ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙයාකාර ය. ඒ දෙකින් සෝවන් මඟ දක්වා ලැබෙන ප්‍රඥාව ලෞකික ය, සෝවන් මඟ සිට ලැබෙන ප්‍රඥාව ලෝකෝත්තර ය. එසේ ම චින්තාමය ප්‍රඥාදි වශයෙන් නානාවිධ ය. ඒ හැමෙකක් ම විස්තර කිරීමට මේ අවස්ථාව නො වෙතත් කීපයක් ගැන සංක්ෂේපයෙන් හඳුන්වනු ලැබේ.

**චින්තාමය ප්‍රඥාව**

අනෙකකු ගෙන් නො අසා සිය සිතින් සිතා මතා ලැබ ගන්නා වූ නුවණ යි. යමක් ගැන හරි වැරැදි සිතීම් ආදී වශයෙන් සිතන්නට පිළිවන් අයට මේ චින්තාමය ප්‍රඥාව ලැබැගැනුම දුෂ්කර නැත. "**නාචින්තයන්තො පුරිසො විසේසමධිගච්ඡති**" නො සිතන තැනැත්තා ගුණ විශේෂයකට පත් නො වන බව ප්‍රකාශවන හෙයින් හැම ගුණයක් ම ඇතිකැරැ ගැනුමට සිතා මතා බැලීම අවශ්‍ය ය. සුමේධ පණ්ඩිතයන් නිර්වාණ ධර්මයක් තිබිය යුතුබව දැනැගත්තේත් මහෞෂධ පණ්ඩිතයන් දුටුවන් පුදුම කරවන උමඟක් සහ විදුලිය නිපදවා ගන්නා ලද්දේත් මේ චින්තාවෙනි. වත්මන්හි නානාවිධ යන්ත්‍රාදිය නිපදවන ලද්දේත් චින්තාමය ප්‍රඥාවෙනි.

**ශ්‍රැතමය ප්‍රඥාව**

පත් පොත් කියැවීමෙන් ද බණ දහම් ආදිය ඇසීමෙන් ද ප්‍රශ්න ඇසීමෙන් ද නොයෙක් දේ ගැන සාකච්ඡා කිරීමෙන් ද මේ ශ්‍රැතමය ප්‍රඥාව ලැබෙන්නේ ය. බහුශ්‍රැතභාවය දියුණු වනුයේ ශ්‍රැතමය ප්‍රඥාව දියුණු වූ තරමට ය.

**භාවනාමය ප්‍රඥාව**

සමසතළිස් කමටහන් අතුරින් යම්කිසිවක් හෝ විදර්ශනාව හෝ වැඩීමෙන් ඇතිකර ගන්නා වූ නුවණ යි.

**ආයකෞශල්‍ය ඥානය**

දියුණුව ඇති කර ගැනීම පිණිස පවත්නා දක්ෂකම පිළිබඳ නුවණ යි. එ ද අයහපත නැතිකිරීම ය, යහපත ඇතිකිරීම ය යි දෙආකාර ය. මේ ධර්ම මෙනෙහි කරන්නාහට නූපන් අකුසල් නූපදිතැයි ද, උපන් අකුසල් ගෙවී යෙතැයි ද, මේ ධර්ම මෙනෙහි කරන්නාහට නූපන් කුසල් උපදිතැයි ද උපන් කුසල් දියුණු වෙතැයි ද ඇතිවන්නාවූ නුවණ යි. මෙසේ දෙලොව දියුණුව සලසා ගන්නට කැමැත්තන් විසින් මේ ආයකෞශල්‍ය ඥානය ඇතිකර ගත යුතු ම ය.

**අපාය කෞශල්‍ය ඥානය**

පිරිහීම් කරුණු දැනගෙන ඉන් වැළැකී සිටින්නට පිළිවන් වන්නේ මේ නුවණිනි. දියුණුව කැමැත්තන් විසින් පළමු කොට පිරිහීම් කරුණු දැනැ ඉන් වෙන් වැ අනතුරු වැ දියුණුවට අදාළ කරුණු පුරුදු කළ යුතු ය. යම් බඳුනෙකැ පැන් පුරවා තබනු කැමැත්තකු විසින් පළමු කොට පැන් පිටවී යන සිදුරු වසා තැබිය යුතු ය. එමෙන් ම දියුණුව කැමැත්තා විසින් පළමු කොට පිරිහීම් දෙරවල් වසාගත යුතුය. මෙය හොඳින් සලකාගත හැකි නුවණ අපාය කෞශල්‍යඥානය යි.

**උපාය කෞශල්‍යඥානය**

ස්ථානෝචිත ප්‍රඥාව ය - තැනට සුදුසු නුවණ ය යි කියන්නේ මීට යි. මේ නුවණ නැත්තහුට කිසිවිටෙකැ ජීවිතය වාසනාවන්ත කර ගන්නට නො පිළිවන. ස්ථානෝචිත ව නුවණ මෙහෙයා ක්‍රියා කරන්නෙක් ම ඒ හැම වාසනාවක් ම ළඟාකර ගන්නේ ය.

**ප්‍රඥාවේ ශ්‍රේෂ්ඨත්වය**

ලෝකයෙහි තිබෙන දියුණුවීම් අතුරෙන් නුවණින් දියුණු වීම තරම් උසස් වූත් - උතුම් වූත් - දියුණුවක් වෙන නැතැයි

තථාගතයන් වහන්සේ දේශනා කළසේක. සෙසු හැම දියුණුවක් ම අස්ථිර ය, තාවකාලික ය, නුවණ දියුණු කර ගැනීමෙන් ලබාගත් දියුණුව ස්ථිර ය. රජ සොර ආදී කිසිවකු විසින් පැහැරගත නොහැකි ය. යහපත් නුවණ මෙහෙයා ක්‍රියා කරන පුද්ගලයන් නිසා රට - දැය - ආගම තුනට කිසි හානියක් නො වන්නේ ය. ඒවා නිරුපද්‍රිතව දීර්ඝ කාලයක් පැවතීමටත් නැණවතුන් ගෙන් ලැබෙන පිටිවහල සුළු පටු නොවේ. තමනට ද යහපත් ජීවිකාවක් ගෙවමින් සුවසේ ජීවත් විය හැකි ය.

එහෙයින් ම තථාගතයන් වහන්සේ "**පඤ්ඤාජීවිං ජීවිතමාහු සෙට්ඨං**" යී දේශනා කළ සේක. ලෝකයේ ඇති තාක් උවදුරු - භය - හිරිහැර ආදි අප්‍රිය අමනාප දේ ඇතිවන්නේ බාලයනැ යි ගැනෙන මෝඩයන් ගෙන් මිස උගතුන් ගෙන් නොවේ. අනුවණ මිතුරාට වඩා නුවණැති සතුරා යහපත් ය 'යි දේශනා කළේ එහෙයිනි. සිය පුතා හෝ මෝඩ නම් ඔහු ජීවිතාන්තය දක්වා ම කරදර කාරයෙකි. ප්‍රඥාව මිනිසුන්ගේ ශ්‍රේෂ්ඨ රත්නය යි වදාළේ මේ ආදී නොයෙක් කරුණු නිසා ය.

### ප්‍රඥාව ලබාගැනීම

උප්පතිත්යේ දී ම සියල්ලන්හට ලැබෙන නුවණ ජාති පඤ්ඤා නමි. ඒ නුවණ කර්මානුරූපව ලැබේ. එහෙයින් එය නොයෙක් තත්ත්වයෙන් පවතී. ඒ ජාති පඤ්ඤාව බීජයක් මෙනි. යහපත් බීජයක් ඊට සුදුසු වූ පාත්තියෙකැ රෝපණය කොට කළමනා සාත්තු සප්පායම් ආදිය කළ කල්හි, එය හොඳින් හැදී අස්වැන්න ලබාගත හැක්කාක් මෙන් ම උප්පත්තියේ දී ලැබුණු ජාති පඤ්ඤා නම් වූ ඤාණ පඤ්ඤා නම් වූ ඤාණ බීජය ශිල්ප ශාස්ත්‍ර නමැති පාත්තිවලැ

වචා වැඩි දියුණු කරගත යුතු ය. පිඬු සිඟා යන භික්ෂුවක් ගෙපිළිවෙළින් පිඬු සිඟා යන්නාක් මෙන් ම නුවණ දියුණු කරගනු කැමැත්තන් විසින් තමන් නො දන්නා දේ දන්නා වූ කාගෙන් වුවත් අසා දැන ගන්නට සූදානම් විය යුතුය. ඒ ඒ අයගේ වතගොත ආදිය ගැන කල්පනා නො කට යුතු යි. 1. සුදුසු වයස පැමිණීම, 2. කීර්තිය - භෝගසම්පත - සම්මානය, 3. ප්‍රශ්න කිරීම, 4. තීර්ථවාසය, යෝනිසොමනසිකාරය, 6. නොයෙක් දේ ගැන සාකච්ඡාව, 7. හිතවතුන් ආශ්‍රය කරමින් වාසය කිරීම, 8. පතිරූප දේශවාසය යන මේ අට නුවණ මෝරවන්නා වූ කරුණු යයි මිලින්ද ප්‍රශ්නයෙහි දක්වා ඇත්තේ ය.

**"සුස්සූසා ලභතෙ පඤ්ඤං**

**අප්පමත්තො විචක්ඛණො"**

යනුයෙන් අසනු කැමති බවත් නුවණ දියුණුකර ගැනීමේ ඕනෑකම කිසිවිටෙකත් නොහරනා බවත්, දැනගන්නා දෙය නුවණින් විමසා දැනගැනීමටත් යන තුන් නුවණ දියුණුවට ඉවහල් කරුණු යැ යි තථාගතයන් වහන්සේ දේශනා කළ සේක. නුවණ දියුණු කරගනු කැමැත්තන් විසින් ඒ කරුණු ඉගෙන හොඳින් ඒවා අනුව පිළිපැදිය යුතු යි.

මෙතෙක් මෙහි හඳුන්වා ලූ කරුණු සත "සත්පුරුෂධර්ම" නමින් ඔබ මේවා දැනගෙන ඒ අනුව පිළිපදින්නෙහි නම් ඔබ නියම සත්පුරුෂයෙකි.



# පිය සමර

"ලොවැ සියල්ල බිඳෙයි නොතිර යි දුක යි"
බුදු රදුන් දෙසුවේ එ සබා දහම් !
ලොවෙහි යම් කිසිවක් හට ගත්තෙ නම්
නැති ව යෙයි, පොදු වී ඔබටත් එ දම් !

පියතුමන් පිය රූ දිවමන් නැතත්
ගුණ කඳින් අප නෙත් නිති තෙත් කෙරේ
තෙද ගුණෙන් තද කම් දිසි මුත් ඔබේ
ළය සෙනේ සැඟැවී උතුරා ගියේ

සිය සුතන් දෙළොසක් දැයටත් දෙමින්
අප මවුන් සමඟින් දිරියෙන් බැඳී
ගුණ නැණින් පොහොසත් කෙරෙමින් නිතින්
යහ සිරිත් කැඩපත් කැරුවෝ ඔබ යි

දිවි මගේ සිතුවම් පෙරළා බලත්
ඔබ වදන් එකිනෙක් සිහිපත් වෙවී
පිය පෙමින් පැවැසූ නන් වන් ඔවා
සිහි නැඟී, හදවත් කඳුළින් තෙමයි

ඉදු කමින් ක-හටත් ගැතිකම් නො පා
හෙළ දැයේ අබිමන් අපටත් පපා
ලද දෙයින් මෙහෙයක් හැමටත් කළෝ
පිය කුසුම් සුවඳේ හැම කල් ගිලෙම්

**තිරිකුණාමලේ ආනන්ද තෙරිඳුන් විසිනි**



# ධර්මවීරයන් විය හැක්කේ කෙසේද? ධර්මවීරයන් ක්‍රියා කළ යුත්තේ කෙසේද?

අනගාරික ධර්මපාල තුමා විසිනි.

ධර්මවීරයන් විය හැක්කේ ප්‍රතිපත්තිගරුක සිල්වත් ගුණවත් ජනහිතකාමී ජීවහිතවාදී විශ්වන්තරවාදී දිවිපෙවතක් ගෙවීමෙනි. සිල්වත් බවේ මූලික අවශ්‍යතාව වන්නේ පස් පවින් වැළකීම යි. ප්‍රාණඝාතයෙහි යෙදෙන්නකුට ජීවහිතවාදියකු විය නොහැකිවා මෙන් ම කිසිම ජීවහිතවාදියකුට ප්‍රාණඝාතයෙහි යෙදිය හැකි නො වේ. පොදු ජාතික සම්පත් අයුතු ලෙස අත්පත් කරගන්නකුට හෝ අන්සතු දේ සොර සිතින් තමන් සතු කරගන්නකුට සිල්වතකු විය නොහැකි ය. කාමයෙහි වරදවා හැසිරෙමින් සදාචාර විරෝධීව කටයුතු කරන කිසිවෙක් සිල්වතෙක් නොවේ. සැබෑ ධර්මවීරයෝ බොරුවෙන් කිසිවකු මුළා නො කරති. ධර්මවීරයෝ සත්‍යවාදීව කටයුතු කරන සත්‍යවාදීහු වෙති. සුරාවෙන් මත් වන්නවුන්ට ධර්මවීරයන් විය නොහැක්කේ ධර්මවීරයන් මනා සිහි නුවණින් ප්‍රඥාවන්තව කටයුතු කරන්නවුන් වන හෙයිනි. ධර්මවීරයෝ කේළම් කියමින් ජනතාව භේද භින්න කරන්නෝ නො වෙති. දහම් මග යන ධර්මවීරයෝ සමාජයට අවැඩදායක වන පරුෂ වදන් නො කියති. ධර්මවීරයෝ අරුත් සුන් හිස් කතාවන්හි යෙදෙමින් මිලකළ නොහැකි කාලය නාස්ති නො කරති. ධර්මවීරයෝ සමාජයට වැඩදායක වන්නා

වූ යහපත් දේ ම කියති. ධර්මවීරයෝ සමාජයට අහිතකර වූ මිච්ඡා ආජීවයේ නො යෙදෙති. සමාජයේ යහපැවැත්මට හානිකර වූ මත්වන දේ වෙළෙඳාම් කිරීම සතුන් මරා මස් විකිණීම වසවිස වෙළෙඳාම් කිරීම හා ජන ජීවිතයට හානිකර වූ සොබා පරිසර විරෝධි කර්මාන්ත ආදියෙහි නොයෙදෙන ධර්මවීරයන්ගේ ජීවන මාර්ගය වන්නේ සම්මා ආජීවය යි.

ධර්මවීරයන්ගේ ජීවිත පැවැත්ම අනවජ්ජ සුඛයෙන් යුතු වේ. තමන්ගේ හැකියාව අනුව සරල සැහැල්ලු දිවිපෙවෙතක් ගෙවන ධර්මවීරයෝ ණයගැති නො වෙති. ණයගැතියන් නොවන නිවහල් අදීන ජීවිත ගතකරන ධර්මවීරයන් වන්නට නම් කිසියම් ආර්ථික පදනමක් හා ශක්තියක් ගොඩනගා ගතයුතු වේ. ධර්මවීරයකු ලෙස තමන්ගේ ම ශක්තියෙන් නැඟී සිටින්නට නම් කිසියම් නිෂ්පාදන හැකියාවක් ඇත්තකු විය යුතු ය. තම දිවිපෙවතට හා තමන්ගෙන් ඉටුවිය යුතු සමාජ වගකීම්භාරය ඉටුකරන්නට අවශ්‍ය සමාජ ආර්ථික පදනම ගොඩනගා ගන්නට නම් තමන් නිර්මාණ හැකියාවන් දියුණු කරගත යුතු ය. ශිල්ප ශාස්ත්‍ර ඥානය වර්ධනය කරගැනීම මඟින් ශිල්පීය හැකියාවත් නිෂ්පාදන හැකියාවත් ලබාගත හැකිවේ. යහපත් ජීවන මාර්ග යකින් සමාජයට වැඩදයක අර්ථවත් ධර්මවීරයකු වන්නට නම් තමන් සතු හැකියාවන් දියුණු කරගෙන සම්මා ආජීවයේ හා සම්මා කම්මන්තයේ යෙදිය යුතු වේ. ජනතාවට අවශ්‍ය ආහාර නිපදවන ගොවිතැන් කටයුතු ජන ජීවිතයට අවශ්‍ය ඇඳුම්, ඖෂධ, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගෘහ භාණ්ඩ, ලිපි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර හා වාහන නිපදවන කර්මාන්ත හා ධාර්මික වෙළෙඳම මඟින් මෙන්ම ගුරු සේවය, ලිපි ලේඛන සැකසීම, සාහිත්‍ය කලාදී සේවාවන් මඟින් ද ධර්මවීරයන් වීමේ සමාජ ආර්ථික පදනම ගොඩනගා ගත හැකිවේ. ධර්මවීරයන්

සැමවිටම නිවැරදි මඟින් ද ධර්මවීරයන් වීමේ සමාජ ආර්ථික පදනම ගොඩනගා ගත හැකිවේ. ධර්මවීරයන් හැමවිට ම නිවැරදි මඟින් දිවිපෙවත සකසා ගන්නා අනවජ්ජ සුඛයෙන් යුතු සම්මා ආජීව මාර්ගයේ ඉදිරියට යන්නවුන් විය යුතු ය.

ජනහිතකාමී, ජීවහිතවාදී, විශ්වන්තරවාදී ධර්මවීරයෝ තම හැකියාවන් දියුණු කරගෙන ලෝකශාසන සේවාවන්හි යෙදෙන ශක්‍යතාවන්ගෙන් යුතු ධීරයෝ වෙති. එසේ ම සැබෑ ධර්මවීරයෝ සෘජු අවංක සද්ජනයෝ වෙති. කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් වන ආකාරයට ධර්මවීරයන් වන්නේ ඉතා ම අවංක ඉතා ම සෘජු ගුණයෙන් යුතු, කරන දේ ම කියන, කියන දේ ම කරන යථාවාදී තථාකාරී උදාර මනුෂ්‍යයෝ ය. එසේ ම කරණීය මෙත්ත සූත්‍රයේ දැක්වෙන අකාරයට සියලු ම ධර්මවීරයෝ සිල්වත්, ගුණවත් සුවචබවින් විය යුත්තාහ. ධර්මවීරයෝ අනෙකුත් අයගේ සිත් ඇදගන්නට තරම් හා සෙස්සන්ට සහනයක් ගෙනදෙන අයුරින් මුදු බවින් මෘදු ගුණයෙන් යුතුවූවෝ වෙති. මෘදු ගුණයෙන් යුතු ධර්මවීරයෝ මිනිසුන් මෙන් ම සිවුපාවන් පවා ආකර්ෂණය කිරීමට සමත් වෙති. සියලු ධර්මවීරයෝ සමාජයේ සහජීවන පැවැත්මට පටහැනිවූ අධිමානයෙන් තොර නිහතමානී ගුණයෙන් යුතු සද්ජනයෝ වෙති. ලද දෙයින් සතුටු වන බව ධර්මවීරයන් සතු යහපිළිවෙතක් හා යහගුණයක් විය යුතු ය. සැහැල්ලු සරල ජීවිත ගතකරන ධර්මවීරයෝ නිසැකවම ලද දෙයින් සතුටුවන අන් අයගේ දේ කඩාවඩා ගන්නට නොසිතන අන් අය සතුටු කරවන්නට වෙහෙසෙන සමාජ සේවකයන් මෙන් ම සියලු සත්ත්වයන්ට සෙතක් ශාන්තියක් වන සොබා පරිසරවාදී ජීවහිතවාදී විශ්වන්තරවාදීන් විය යුත්තාහ.

දහම් මඟ යන ධර්මවීරයෝ තමන්ට ඔරොත්තු නොදෙන තරම් කටයුතු පටලවා ගන්නෝ නො වෙති. තමන්ගේ හැකියාවට ඔරොත්තු නොදෙන තරම් වැඩකටයුතු

පටලවා ගන්නවුන් තමන්ටත් අනුන්ටත් අයහපතක් ම කරන්නවුන් බවට පවත්වන හෙයින් ධර්මවීරයෝ කරණීය මෙත්ත සූත්‍රයෙන් පහදදෙන අන්දමේ අප්පකිච්චෝ ගුණයෙන් යුතුවිය යුත්තාහ. සමාජයටත් තමන්ටත් බරක් නොවන සැහැල්ලු දිවිපෙවතක් ගෙවන්නට හුරුපුරුදු වීම ධර්මවීරයන් වීමෙහිලා වැදගත්වන අවශ්‍යතාවක් වේ. සැබෑ ධර්මවීරයෝ සන්සුන් ඉඳුරන් ඇති ඉන්ද්‍රිය දමනයෙන් යුතු මනා සිහිනුවණින් කටයුතු කරන ප්‍රඥාවන්තයෝ වෙති. මනා සිහිනුවණින් කටයුතු කරන ප්‍රඥාවන්තයන්ගෙන් තමන්ටත් තම හිතවතුන්ටත් සමාජයටත් අවැඩක්, වරදක්, නොවනු නිසැක ය. සියලු සත්ත්වයන් කෙරේ මෙත්සිත් පතුරන කරණීය මෙත්ත සූත්‍රයට අනුව දහම් මඟ යමින් ලෝක ශාසන සේවාවන්හි යෙදෙන ධර්මවීරයෝ තමන්ගේ සමාජ කටයුතුවලට හා ආධ්‍යාත්මික දියුණුවට බාධාවන අයුරින් තම පවුලේ අය සමඟ හෝ ඥාති හිතෛෂින් සමඟ හෝ සීමාන්තික බැඳීම් ඇතිකර නො ගනිති. ඒ ගුණය අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ යනුවෙන් කරණීය මෙත්ත සූත්‍රයෙහි දැක්වේ. එසේම ධර්මවීරයෝ කිසිවිටෙකත් ප්‍රඥාවන්තයන්ගේ ගර්හාවට ලක්වන කිසිදු වරදක් නො කරති. ධර්මවීරයෝ සැම විට ම සමාජයේ සදචාර සංවර්ධනයට සංස්කෘතික අභිවෘද්ධියට හා යහ පැවැත්මට හේතුවන ආකාරයෙන් ධර්මානුකූලව කටයුතු කරති. එසේ ධර්මානුකූල දිවිගෙවමින් ධර්මවීරයන් මෙන් කටයුතු කරන්නවුන් සියලු මනුෂ්‍යයන්ගේත් සියලු සත්ත්වයන්ගේත් යහපත ප්‍රාර්ථනා කරන, ඒ වෙනුවෙන් කැපවුණු, පෙනෙන නොපෙනෙන සකල ලෝකවාසීන් කෙරේ මෛත්‍රිය පතුරන විශ්වන්තරවාදයෝ වෙති.



# ඉතින් ආයුබෝවන් ලක් මවුනි ගරු

(සිරිලක රාජ වංශය නිමා කරමින් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිර භාරයට ගෙන පෙබරවාරි 18 වන දිනට වර්ෂ 200 ක් පිරීම නිමිත්තෙනි.)

**සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය පූජ්‍යපාද මීගොඩ සුඛිත හිමියන් විසිනි.**

දුවේ පුතේ,

මම ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා. එහෙම නැතිනම් සිංහලේ අවසන් රජතුමා. මගේ නම කියූ පමණින් ඔබ සැමට ලොකු තරහක් මා සමග උපදින බව මා දන්නවා. ඒ මා නපුරු රජෙකැයි ඉතිහාසයේ ලියා ඇති බැවිනි. ඔව් මා නපුරුකම් කළ බව මා පිළිගන්නවා. ඒත් මටත් ඔබට කියන්න කතාවක් තිබෙනවා.

මා සිංහල බෞද්ධ නොවන නායක්කාර් වංශික දෙමළ රජකු බව ඇත්ත. ඒත් මා බුදු දහමත් සිංහල ජාතියත් මාගේ පණ සේ රැක ගැනීමට උත්සාහ කළා. ඒ බව මම ලංකාවෙන් අවසන් වරට පිටත්ව ගිය 1816 ජනවාරි 24 වන දා කළ කතාවෙහි දක්වා තිබෙනවා. එහෙත් සමහර බලලෝභී උඩරට රදළ නායකයන්ට ඕන කළේ මගෙන් සිහසුන පැහැර ගන්න. ඒ වෙනුවෙන් ඒ අය මට විරුද්ධව ඉංග්‍රීසීන්ට ගතු කියමින් කුමන්ත්‍රණ කළා. අන්තිමට පිළිමතලාවේ අදිකාරම් මාව මරන්න පවා කුමන්ත්‍රණය කළා. මේ කුමන්ත්‍රණය හසු වූ නිසා මා ඔහු ඇතුළු සත් දෙනෙකුට 1811 අගෝස්තු 26 දා මරණ දඬුවම ක්‍රියාත්මක කළා. දුවේ, පුතේ මරණ දඬුවම

මහ නරක එකක් තමයි. ඒත් එදා උඩරට නීතිය අනුවත්, රජු ලෙසත් මට ඒ තීරණය ගන්න සිදුවුණා.

ඊට පසුව මහ අදිකාරම් ධුරය පැවරුණේ ඇහැලේපොළට. මා හිතුවා ඔහු මට පක්ෂව යටහත්ව ක්‍රියා කරයි කියලා. ඒත් අන්තිමට ඇහැලේපොළටත් උඩරට සිහසුන ගැන ආසාව ආවා. ඔහු මට විරුද්ධව සබරගමුවේ කැරැල්ලක් ඇති කළා. ඒ විතරක් නෙමෙයි මට විරුද්ධව බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා සමඟ ලිපි ගනුදෙනු කළා. මේ වෙනකොට මා ඉතාම නරක පුරුද්දකට ඇබ්බැහි වෙලා හිටියා. ඒ තමයි මත් දිය පානය. මා හැමදාම රාත්‍රියට මතින් මත් වෙලා සිහිය විකල් වෙලයි හිටියේ. මාව රවටාගෙන යම් යම් දේ මා ලවා කරවා ගැනීමට කැමති නිලධාරීන් මට හොඳට මත්පැන් බොන්න දී මාව මුළා කළා. මා ගත් නරකම තීන්දුව වූ ඇහැලේපොළ කුමාරිහාමි ඇතුළු දරුවන් මැරවීම සිදු කළේ ද මා අධික ලෙස බීමත්ව සිටින විටක දී යි. ඇහැලේපොළගේ තරහකාරයකු වූ පුස්සැල්ල නිලමේ මා බීමතින් සිටින විටක පැමිණ මේ දඬුවම ක්‍රියාත්මක කිරීමට අත්සන් ගත්තා. 1814 මැයි 17 වැනි දා ඒ කෲර සිදුවීම සිදුවුණා. මුළු උඩරට රාජධානියම මළ ගෙයක් වුණා. උඩරැටියන් දින ගණනක් ළිප ගිනි දැල්වූයේ නැහැ. ආහාර ගත්තේ නැහැ. මටත් මේ සිදුවීම නිසා රාත්‍රියට නින්ද ගියේවත් නෑ. අවසානයේ මා තව තවත් මත්පැනටම ලොල් වුණා. බොහෝ මිනිසුන් මරා දැම්මා. බොහෝ අකුසල් කර ගත්තා.

අවසානයේ මේ දුර්වලම මොහොත බලා බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා උඩරට ආක්‍රමණය කළා. මා සටන් නොවැද ම පලා ගියා. මගේ බිසෝවරු දෙපළ සමඟ සැඟවී සිටියත්, මැද මහනුවර බෝමුරේ උඩපිටිය ආරච්චිගේ නිවසේ දී ඉංග්‍රීසි සේනාවට මාව හසුවුණා. මේ සිදුවීම සිදු වූ 1815 පෙබරවාරි 18

වෙනි දා පුරා වර්ෂ දෙදහස් තුන්සිය පනස් අටක් අවිච්ඡින්නව ආ ලක්දිව රාජවංශය නිමාවට පත්වුණා. එදා මට නො විඳිනා දුක් විඳින්න සිදුවුණා. මාවත් බිසොවරුන්වත් නිරුවත් කරලා වැල් වලින් බැඳලා බිම දිගේ ඇදගෙන ගියා. මා කර ගත් විශාල අකුසල් වලට විපාක දීම ආරම්භ වුණා කියලා එදා තේරුම් ගත්තා. 1815 මාර්තු 2 දා මහනුවර මඟුල් මඩුවේ දී ගිවිසුමකින් උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට පැවරුණා. සිංහල කොඩිය වෙනුවට කතිර කොඩිය මහ මළුවෙන් අහසට නැගුණා. මාව පසුව කොළඹට ගෙනත් සිරගත කළා. 1816 ජනවාරි 24 වෙනි දා මාවත් බිසෝවරුනුත් වෙල්ලෝරයට පිටුවහල් කළා. මම බොහෝ අකුසල් කර ගත් කෙනෙක්.

දුවේ, පුතේ, මම ඔබෙන් ඉල්ලීම් කීපයක් කරනවා. කවදාවත් මත්පැන්, මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙන්න එපා. මහා විනාශයක මුල එයයි. නපුරු දුදනන්ව ඇසුරු කරන්න එපා. ඔවුන්ගේ කේළම් බස් විශ්වාස කරන්න එපා. කල්‍යාණ මිත්‍රයන් ම ඇසුරු කරන්න.

තවත් දෙයක් කිව යුතු ම යි. දුවේ පුතේ එදා සිංහල නායකයන් භේද නොවී එක්සත්ව ක්‍රියා කළා නම් කවදාවත් මේ රට ඉංග්‍රීසීන්ට යටත් කර ගන්න බැරිව යනවා. යුරෝපීය ජාතීන් තුන් පිරිසක් අවුරුදු 300 ක් පුරා වෑයම් කරලත් දිනා ගන්න බැරි වූ රට නිකම් ම ඉංග්‍රීසීන් ලබා ගත්තේ සිංහලයාගේ අසමඟිය නිසයි. **ඒ නිසා සිංහලයා ගේ සමඟිය ජාතියේත් සමඟිය බව හොඳින් මතක තියා ගන්න.**

"විකුම් සිහළ පරපුර සිහි තිබෙන තුරු
උතුම් රාජ ලේ ටික මගෙ සිඳෙන තුරු
නෙතින් කඳුළු නොහෙළමි දිවි තිබෙන තුරු
ඉතින් ආයුබෝවන් ලක් මවුනි ගරු"



# සතුට සොයන ඔබ වෙත.....

තෙරුවන් සරණයි !

(අංගුත්තර නිකාය, චතුක්ක නිපාතයේ පත්තකම්ම සූත්‍රය ඇසුරින් සැකැසුණු ලිපියකි.)

**(පොඩි හාමුදුරුවෝ විසිනි.)**

එක් දිනක් අනාථපිණ්ඩික ගෘහපතිතුමා බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ සකසා වැඳ එකත්පස්ව සිටියේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඔහු අමතා මෙසේ වදාළ සේක:

"ගෘහපතිය" මේ ලෝකයේ යම් පුද්ගලයකු බොහෝ සෙයින් කැමති ප්‍රාර්ථනා ධර්ම සතරක් වේ. ඒ ධර්ම සතර මොනවාද?

"මට දැහැමින් භෝග සම්පත් ලැබේවා" යන පැතුම පළමුවන දහම යි.

"දැහැමි ව භෝග සම්පත් ලබාගෙන නෑයන්, හිත මිතුරන් අත් නොහැර මාගේ පරිවාර සම්පත් දියුණු වේවා" යන පැතුම දෙවන දහම ය.

"දැහැමි මග නො බිඳ භෝග සම්පත් ලබාගෙන නෑයන් හිත මිතුරන් පිරිවර සම්පත් ලබාගෙන දිගු කලක් ජීවත් වෙමි" යන පැතුම තෙවන දහම යි.

"දැහැමින් භෝග සම්පත් ලැබ, නෑයන් හිත මිතුරන් හා පිරිවර සම්පත් ද, දීර්ඝායුෂ ද ලබාගෙන මරණින් මතු සුගතිගාමී වූ දිව්‍ය ලෝකයෙහි උපදිමි" යන පැතුම සිවු වන දහම ය.

"ගෘහපතිය, යම් පුද්ගලයකු මේ දුර්ලභ වූ කාරණා තමන් ගේ ජීවිතයයෙහි දකිනු කැමති නම් ඔහු විසින් තමා තුළ ඇති කරගත යුතු කාරණා සතරක් වේ. එනම් **සද්ධා සම්පද, සීල සම්පද, චාග සම්පද, පඤ්ඤා සම්පද** යන සතර යි.

**සද්ධා සම්පදව** නම් කුමක් ද? බුදුරජාණන් වහන්සේ අර්හත් ය, සම්‍යක්සම්බුද්ධ ය, විජ්ජාචරණසම්පන්න ය, සුගත ය, ලෝකවිදූ ය, අනුත්තර පුරිසදම්මසාරථී ය, සත්ථා දේවමනුස්සානං ය, බුද්ධ ය, භගවත් ය. මෙලෙසින් යම් කෙනෙක් පළමුව බුදුරජාණන් වහන්සේ ගේ සම්‍යක් සම්බෝධිය විශ්වාස කරයි. එසේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ඇති කරගන්නා පැහැදීමෙන් යුතු ඒ ඥාණවන්ත පුද්ගලයා දෙවනුව ජීවිතය පුරාවට ම බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙහි අවබෝධයෙන් හැසිරෙයි. එවිට ඔහු සීලයක හික්මීම ආරම්භ කරයි.

එම **සීල සම්පදව** නම් කුමක් ද? මේ ලෝකයේ ආර්යශ්‍රාවකයා ප්‍රාණඝාතයෙන් ,අන්සතු දෑ හොරෙන් ගැනීමෙන්, කාමයෙහි වරදවා හැසිරීමෙන්, බොරු කීමෙන්, මදයට හා ප්‍රමාදයට කරුණු වන රහමෙරින් දුරුවූයේ වේ. මේ පංචසීල ප්‍රතිපදවේ නිවැරදිව හැසිරෙන පුද්ගලයා ජීවත් වන පරිසරය තුළ දී මිනිසකු සතු විය යුතු මිනිස් ගුණ නොඉක්මවා කටයුතු කරන්නට කිසි විටෙකවත් නොපෙළඹෙයි. එබැවින් බොහෝ සාමකාමී පිරිසිදු ජීවිතයක් ඔහුට හිමි වේ. මිනිස් ගුණවලින් පෝෂිත ඔහු වටා සත්පුරුෂ පිරිස් එක්රොක් වීම සිදුවේ. එකිනෙකා තුළ පිවිතුරු අදහස් ගැළපීමේ ධර්මතාව මෙයට හේතු වේ. මෙලෙසින් නිරවුල් වූ පිවිතුරු වූ තෘප්තිමත් මනසක් හිමි ඒ පුද්ගලයා බොහෝ කාලයක් සුවසේ තමා සතු පරමායුෂ භුක්තියද සුවසේ වින්දනය කරයි. පන්සිල් රකින ඒ පුද්ගලයා වැරදි ක්‍රමෝපායන් මගින් භෝග රැස් කිරීම

සිදු කරන්නට කිසි විටෙකවත් නොපෙළඹෙන්නේ ලැජ්ජා - බිය යන දෙකරුණත්, පොදුවේ ලොව සැමගේ පරිභෝජනය සඳහා ඇති සම්පත් සමසේ බෙදී යා යුතුය යන උතුම් හැඟීමත් නිසා ය. එලෙස ඔහු ක්‍රමයෙන් තමන් සරණගිය ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාව තුළ තවදුරටත් ඉදිරියට යන්නේ ය. එදහම තුළ හැසිරීමෙන් ලැබෙන මානසික තෘප්තිය අන් භෞතික තෘප්තීන්ට වඩා උසස් වන බැවිනි.

මිනිස් ලොව තුළ උපදින සෑම මිනිසකුට ම සමාන ලෙසින් පොදු අයිතිවාසිකම් හා සම්පත් බෙදී නොයන සමාජගත ගැටලුවක් ලොව හැම කාලයක ම පවතී. කර්මානුරූපීව ඔවුන් මේ ස්වභාවය ලැබුව ද ඔවුන් සැම දෙනාමත් මනුෂ්‍යයෝ ය. එබැවින් නුවණැතයෝ ඇති නැති සැමට තමන්ට හැකි අයුරින් තමන් සතු දේ පරිත්‍යාග කිරීමට යොමුවෙති. එය වඩාත් අර්ථාන්විතව සිදුකරන අන්දම තථාගතයන් වහන්සේ මෙසේ දේශනා කර ඇත.

**චාග සම්පදාව** නම් කුමක් ද? ගෘහපතිය, ආර්යශ්‍රාවකයා මසුරු මල දුරු කරන සිතින් යුතුව ගිහි ගෙදර වාසය කරයි. කවරෙකු හෝ උදෙසා පූජා කළ අතහරින ලද වස්තුවෙහි බැඳුම් නැත්තේ වේ. පරිත්‍යාගයට යොමු වුණු අත් ඇත්තේ වේ. එබැවින් ඔහුගෙන් යමක් ඉල්ලීමට සුදුසු වූයේ වෙයි. දීමෙහි හා බෙදීමෙහි නිරත වූයේ වේ. හුදෙක් මේ පිළිවෙත තුළින් අතහැරීමෙන් ලබන මානසික සතුට පමණක් නොව එසේ ඇති කරගන්නා අතහැරීමේ යහපත් සිතිවිලි දමය ඔහුහට නීරෝගී සුවපත් දිවියක් උදා කර දෙන්නේ ය. ඊ ස් කරගැනීමේ දී ඇතිවන අසහනකාරී (බිය, කනගාටුව, කලබලකාරී ස්වභාවය) තත්ත්වයන් ද ඔහු තුළ ඇති වන්නේ නැත.

මෙලොව උපත ලද සෑම මිනිසකු සතුව සුවිශේෂී වූ මනසක් තිබේ. එසේ සැමට මනසක් හිමිවුවත් බොහෝ විට ලොව සිදු වන්නේ එකිනෙකා විසින් ක්‍රමානුකූලව තමන්ගේ මනස පුබුදුවාගැනීම පසෙකලා දීන ලෙස අනුන් මත යැපෙන්නට තරම් තමන් ගේ මනස දුර්වල කරගැනීම යි. එසේත් නොමැති නම් දියුණු මනසක් නැති තිරිසන් සතුන් හැසිරෙන අයුරින් ක්‍රියා කිරීමයි. තමා ගේ ඇති වටිනාකම හඳුනා නොගැනීමයි. මේ මනස පුබුදුවා ගැනීමේ කටයුත්ත ක්‍රමවත් අයුරින් සිදු කරගැනීමට යමෙක් බලාපොරොත්තු වන්නේ නම්, එයට බුදුන් වහන්සේ ගේ දේශනාව තුළින් භාවනාව නම් සුවිශේෂී භූමියක හැසිරෙන්නට අවස්ථාවක් ඔහුට හිමි වේ. එය නුවණැති වූ ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් බැවින් පඤ්ඤා සම්පදාව නමින් ද හඳුන්වීමට පිළිවන.

**පඤ්ඤා සම්පදාව** නම් කවරේ ද? ගෘහපතිය, (අභිධ්‍යා විෂම ලෝභයෙන්) තමන් සතු දේ කෙරෙහිත්, අනුන් සතු දේ කෙරෙහිත් ලෝභයෙන් යුතු සිතක් ඇතිව වෙසෙන පුද්ගලයා නො කළ යුතු දේ කරයි. කළ යුතු දේ නොකරයි. ඒ හේතුවෙන් යසසින් හා සුවයෙන් පිරිහේ. (ව්‍යාපාදයෙන්) තරහ වෛරයෙන් යුතු සිතක් ඇතිව වෙසෙන පුද්ගලයා නො කළ යුතු දේ කරයි. කළ යුතු දේ නොකරයි. ඒ හේතුවෙන් යසසින් හා සුවයෙන් පිරිහේ. (ථීනමිද්ධයෙන්) යහපත් වූ දෑය කිරීමට නොනැමෙන සිතක් ඇතිව අලසව වෙසෙන පුද්ගලයා නො කළ යුතු දේ කරයි. කළ යුතු දේ නොකරයි. ඒ හේතුවෙන් යසසින් හා සුවයෙන් පිරිහේ. (උද්ධච්චකුක්කුච්චයෙන්) විසිරීමෙන් යුතු සිතක් ඇතිව එමෙන්ම නොකළ වරදක් කෙරෙහි පසුතැවීමෙන් වෙසෙන පුද්ගලයා නො කළ යුතු දේ කරයි. කළ යුතු දේ නොකරයි. ඒ හේතුවෙන් යසසින් හා සුවයෙන් පිරිහේ. (විචිකිච්ඡා) සෑම තැන්හිම සැකයෙන් යුතු

සිතක් ඇතිව වෙසෙන පුද්ගලයා නො කළ යුතු දේ කරයි. කළ යුතු දේ නොකරයි. ඒ හේතුවෙන් යසසින් හා සුවයෙන් පිරිහේ.

ගෘපතිය, ආර්ය ශ්‍රාවකයා අභිධ්‍යා විෂම ලෝභය හිතට කිලුටක් යැයි දැන එය අත් හරියි. එසේ ම ව්‍යාපාදය, ථීනමිද්ධය, උද්ධච්චකුක්කුච්චය, විචිකිච්ඡාව යන මේවා සිතට කිලුටකැයි දැන දුරු කරයි. ඉහත කී නීවරණ සැබැවින් ම යහපත මෙන්ම බුදුදහමේ උත්තමාර්ථයත් බොහෝ දෙනෙකුට අහිමි කරන්නේ ය. එබැවින් තථාගතයන් වහන්සේ තම ශ්‍රාවකයන් මේ නිවරණ බැම්මෙන් මුදවනු පිණිස පිළිවෙතක් දේශිතය හ. ක්‍රමක්‍රමයෙන් මේ නීවරණ යමෙකු ගේ සිතින් බැහැර වන විට බොර පැදුනු ජලය සෙයින් ඔහු ගේ සිත පිරිසිදු වේ. සැම දෙයක ම සත්‍ය වූ ස්වභාවය ඒ පුද්ගලයාටම දැකගත හැකි වන්නේ ය. ගෘහපතිය, යම් කලෙක ආර්යශ්‍රාවකයා අභිධ්‍යා විෂම ලෝභය, ව්‍යාපාදය, ථීනමිද්ධය, උද්ධච්චකුක්කුච්චය, විචිකිච්ඡාව යන මේවා සිතට කිලුටක් යැයි දැන ඒවා ප්‍රහීණ කෙරේ ද, එම ආර්ය ශ්‍රාවකයා මහා ප්‍රාඥ යැයි ද පෘථුල ප්‍රාඥ යැයි ද, සියුම් දේ දැනීමෙහි සමත් නුවණැත්තේ යැයි ද, ප්‍රඥසම්පන්න යැයි ද කියනු ලැබේ.

ගෘහපතිය, මේ ආර්යශ්‍රාවකයා ඉහත කී සම්පදවලින් යුතුව, උට්ඨානවීර්යයෙන්, බාහු බලයෙන්, දහඩිය වගුරා, සම්පාදනය කර ගත් දැහැමි භෝගයෙන් කටයුතු සතරක් කරයි. එම සතර නම්;

දැහැමින් ලැබූ භෝගයෙන් තමා සැපවත් වේ. බලසම්පන්න වේ. සැපසේ පරිහරණය කරයි. අඹු දරු, දැසි දස්, කම්කරු ආදි පිරිවර ජනයා සැපවත් කරයි. මැනවින් පරිහරණය කරයි. මේ පළමුවන කටයුත්ත වේ.

ආර්යශ්‍රාවකයා එසේ ලද දැහැමි භෝගයනට ගින්නෙන්, දියෙන්, සොරුන්ගෙන්, රජුන්ගෙන්, අප්‍රියයන්ගෙන් යම් විපතක් වේ නම් එම විපතින් වළක්වාගෙන තමාගේ ආත්මය සුවපත් කරගනී. මේ දෙවැන්න යි.

එසේ දැහැමින් ලැබූ භෝගයෙන් ඤාතීන්ට සංග්‍රහය ද, ආගන්තුකයන්ට සත්කාර කිරීම ද, රජයට අයබදු ගෙවීම් ආදිය ද, එම මුදල් වැයකොට යම් යම් යහපත් දෑ සිදු කොට මියපරලොව ගිය අය උදෙසා හා සම්දිටු දෙවියන් උදෙසා පින් අනුමොදන් කිරීම ද යන මේ (පංචබලීහු) සිදු කරයි. මේ තුන් වැන්න යි.

දැහැමින් ලද භෝග සම්පත්, මදයෙන් හා ප්‍රමාදයෙන් වෙන් වූ, කෙලෙස් සන්සිඳ වූ , ක්ලේශ පරිනිර්වාණය කළ මහණ බමුණන් කෙරෙහි දක්ෂිණා වශයෙන් පරිත්‍යාග කරයි. මේ සතර වැන්නයි.

ගෘහපතිය, ආර්යශ්‍රාවකයා මෙකී සතර කර්ම හෙවත් යෝග්‍ය කර්ම කරන්නේ වේ.

ගෘහපතිය, මේ සතර ප්‍රාප්තකර්ම (යෝග්‍ය කර්ම) නොකර යමකු ගේ භෝග ක්ෂය වීම වේ නම්, එය අස්ථානගත යැයි ද, අප්‍රාප්තගත යැයි ද අනායතන පරිභුක්තිය යැයි ද කියනු ලැබේ.

යමකුට මේ සතර ප්‍රාප්තකර්මයන් සඳහා භෝග වැය වේ නම් එම භෝග ස්ථානගත යැයි ද, ප්‍රාප්තගත යැයි ද, ආයතන පරිභුක්ත යැයි ද කියනු ලැබේ.

බුදු දහමෙහි විස්තර වන කෙනෙකු ගේ මරණය අවස්ථාවේ දී පහළ වන අවසාන සිතිවිලි පරම්පරාව යහපත් වූවක් නම් ඔහු ගේ ඊළඟ භවය සුගතිගාමී කරගත හැකි ය. මේ සිතිවිලි දමය බොහෝ විට තමන් විසින් බොහෝ කාලයක් පුරා

පුරුදු කරන ලද වඩන ලද ක්‍රියාවන්හි දී පැවැත්වූ සිතිවිලි දමයක් විය හැක. එබැවින් මේ දහම් මගෙහි ජීවත් වූ සැබෑ ආර්යශ්‍රාවකයා හට මරණය හමුවේ දී ද භාවනාවෙන් තැන්පත් කරගත් මනසක් හිමි ඔහුට, මෙසේ සිහිපත් කළ හැකි වන්නේ ය.

මා විසින් භෝග භුක්ති විඳින ලදී. පෝෂණය කළ යුත්තන් පෝෂණය කරන ලදී. විපත් පැමිණි කල ඒ සඳහා යොදන ලදී. මතු මත්තෙහි විපාක දෙන දක්ෂිණා පිරිනමන ලදී. පංචබලි කරන ලදි.

බ්‍රහ්මචාරී සිල්වතුනට උපස්ථාන කරන ලදී. ගිහි ගෙයි වාසය කරන නුවණැත්තා යම් ප්‍රයෝජනයක් සඳහා භෝග සම්පාදනය කරන්නේ නම් මා විසින් එම ප්‍රයෝජනය ලබන ලදී. පසුතැවිලි නොවන කටයුතු කරන ලදී.

පංචශීල ධර්මයෙහි පිහිටි පුද්ගලයෙක් මෙසේ සිහි කරන්නේ නම් ඔහු මෙලොව ප්‍රශංසාව ලබයි. එමෙන් ම පරලොව සුගති විපාක ලබා සතුටු වේ.

---

## නුවණැත්තාගේ නුවණැති පියවර

**අනුපුබ්බේන මේධාවී - ථෝක ථෝකං ඛණේ ඛණේ**

**කම්මාරෝ රජතස්සේ'ව - නිද්ධමේ මලමත්තනෝ**

නුවණැත්තා රිදියෙහි  මල හරින රන්කරුවා මෙන් මොහොතක් මොහොතක් පාසා ටිකෙන් ටික පිළිවෙළින් තමාගේ කෙලෙස් මල ඉවත් කර ගන්නේ ය.

(ධම්මපදය - මල වග්ගය)



# පොදු යහපත - දේවි සැපත

පුෂ්පා ජයවර්ධන නැන්දා විසිනි.

කඳු මුදුනින් පැන නැඟී
ගල් පරවල හැපි හැපී
මා යන ගමනක සිරි
බලනු මැනවි ළමයිනි

සෙමෙන් නඟා දිය රැලී
පෙණ කැටි පාවෙයි වෙළී
ආපසු ඒමක් නැතී
ඉදිරියට ම යයි ඇදී

මිටියාවත් පසු කරන්
ගොඩ මඩ දෙක සරු කරන්
කාටත් සෙත සලසමින්
මම යමි ගමනක් හෙමින්

යහගති ගුණ හුරු කරන්
පොදු යහපත ගැන සිතන්
පුංචි සිතට දිරි අරන්
පෙරට ම  යනු මැන නිතින්



# මහා අශ්වාරෝහක ජාතකය

**විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂ්මී පෙරේරා මහාත්මනිය විසිනි.**

ගුණ සාගරයක් බඳු වූ අප තථාගතයන් වහන්සේ දෙව්රම් වෙහෙර දී ආනන්ද තෙරුන් වහන්සේ උදෙසා මෙම ජාතක ධර්මය වදාළ සේක. එනම්, යම් කෙනෙකු තවෙකකු හට උපකාර කළ විට, තමාට කළ උපකාරයට ප්‍රත්‍යුපකාර කිරීම යහගුණ ඇත්තන්ගේ ක්‍රියාවක් බව, බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුණුවන් හට පහදා දුන් සේක.

පෙර කල අප මහ බෝසතාණෝ බරණැස් නුවර රජුව දැහැමි පාලනයක් ගෙන ගියහ. එහෙත් එක් පසල් දනව්වක ඇති වූ යුද්ධයක් මර්දනය කිරීමට රජතුමා මැදිහත් විය. අශ්වාරෝහකයකු ලෙස පැමිණි රජු නොසිතූ ලෙස පරාජයට පත් විය. යුද්ධයට සැරසී සිටි සොල්දාදුවන් සිටි ගම්මානයට බෝසත් අශ්වාරෝහක රජ ඇතුළු විය. රජතුමා දුටු ඇමතිවරු තමන්ගේ නිවෙස් තුළට වී සැඟවී සිටියහ. එක් ඇමතිවරයකු පමණක් අශ්වාරෝහකයාට පිහිටවීමට පැමිණියේ ය. ඔහු "මේ පැමිණ ඇත්තේ රාජ පුරුෂයකු විය යුතු" යි සිතා තම බිරිඳ සමඟ කතිකා කර, ඔහුට උවටැන් කර, අසුට ද සාත්තු සප්පායම් කළේ ය. එහි ටික දිනක් ගත කළ අශ්වාරෝහකයා පිටත්ව යන දිනයේ දී, ඇමතිවරයා අමතා,

"මිතුර, මම අශ්වාරෝහකයෙක්මි. නගරයට එන දිනෙක අප නිවසට ද පැමිණෙන්න. මහ වාසල් දොරකඩ සිටින දොරටුපාලයාගෙන් මගේ ගෙය අසා දැනගන්නැ'යි කීහ."

නුවර වැසියෝ අශ්වාරෝහක ලෙස සිටි රජතුමා පිළිගෙන මාළිගයට වැඩම වූහ. රජතුමා දොරටුපාලකයා ගෙන්වා "ගම්

වැසියකු මෙහි පැමිණේවි. ඔහු මහා අශ්වාරෝහකයාගේ නිවස විමසුවොත් මා වෙත කැඳවාගෙන එන්නැ"යි කීහ.

රජතුමා ගම් වැසියා නුදුරු දිනයෙක එතැයි සිතා සිටි මුත් ඔහු නො ආයේ ය. එම ගමෙහි බදු වැඩි කළහොත් ඒ ගැන පැමිණිලි කිරීමට මිතුරු ගම් වැසියා ඒ යැයි සිතා රජ වරින් වර බදු වැඩි කළේ ය. එහෙත් මිතුරා පැමිණියේ නැත. බදු බරින් මිරිකී සිටි ගම්මු, යහ ගුණැති ගම් වැසියා හමු වී ඔවුන්ගේ දුක් පීඩා පවසන ලෙස ඉල්ලූහ. ඔහු රස කැවිලි, තෑගි බෝග රැගෙන තම බිරිඳ සමඟ අශ්වාරෝහක මිතුරා හමුවීමට ගියේ ය. කලින් පවසා තිබූ පරිදි දොරටුපාලයාගෙන් විමසූ කල ඔවුන් දෙදෙන රැගෙන ගියේ රජ වාසල වෙත ය. පුදුමයට පත් වූ සැමියා හා බිරිඳ, රජතුමා හා දේවිය විසින් තුටු සිතින් පිළිගෙන, රස මසවුළෙන් සංග්‍රහ කර, රාජාභරණයෙන් සරසා තම රාජ්‍යයෙන් අඩක් තෑගි කළේ ය. මිතුරෝ දෙදෙනා දැහැමින් විශ්වාසවන්තව රාජ්‍යය පාලනය කළහ.

මෙය නොඉවසූ ඇමතිවරු, රජුගේ පුත් කුමරු උසි ගන්වා ගොවියකුට රජකම දුන් නිසා කුමරු හට අසාධාරණයක් වන්නේ යැයි කීහ. පුත් කුමරු පිය රජුගෙන් මේ ගැන විමසූ කළ රජතුමා,

"පුත, මා පරාජිතයකු වූ කල, මාගේ ජීවිතය රැක දුන්නේ මොහුයි. මා බරණැස් රජු වූයේ එහෙයිනි. මා නොලද තවත් සම්පත් තිබේ දැ විමසූහ."

එය අවබෝධ කරගත් කුමරාහට අප උපකාර කළ යුත්තේ මන්දැයි පහදා දුන්හ.

"පුත, අපට පිහිට වන ඇත්තන්ට අප පෙරළා උපකාර කළ යුතු යි. සම්පත් ලබා දිය යුතු යි. උපකාර අමතක කරන්නා, ආපදාවට ලක් වූ විට පිහිට වීමට හිතවත්තු නො පැමිණෙති. මේ බව හොඳින් වටහා ගන්න."

ඈත අතීතයේ දී යහපත්, හිතමිතුරු ගැමියා ආනන්ද තෙරණුවෝ ය. බරණැස් රජු තමන් වහන්සේ යැයි බුදුරජාණන් වහන්සේ වදාළ සේක.

බරණැස් රජතුමා තම පුතුට ලබාදුන් අවවාදය, අප සිතට ගතහොත් වටනේ ය. ඒ අද දිනටත් ගැළපෙන මහඟු අවවාදයකි.